# වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් පිළිඹිබු වන තත් කාලීන අධිකරණ ව්‍යවස්ථාව

පී.කේ. වාසනා සෙව්වන්දි*

ලක්දිව ඉතිහාසය පිළිබද කරුණු විමසා බැලීමේදී සාහිත්‍ය මූලාශවලින් ලැබෙන දායකත්වයට වඩා වැඩි දායකත්වයක් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ලැබේ. මෙහිදී ශිලා ලිපි, පුරාණ කාසි, ස්මාරක, මූර්ති, කැටයම් හා චිත්‍ර යන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් මෙහිදී භාවිතයට ගනියි. මෙකී මූලාශ්‍ර අතුරින් ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගැනිමෙහි ලා ප්‍රාමාණික වන ප්‍රධානතම මූලාශ්‍රය ලෙස ශිලා ලේඛන නම් කළ හැකි ය. එසේ නම් කළ හැකි ශිලා ලේඛනයක් ලෙස වේවැල්කැටිය ශිලා ලේඛනය හැඳින්විය හැකිය. වේවැල්කැටිය ශිලා ලේඛනය සිව්වන මිහිඳු රජුගේ රාජ්‍ය සමයට (ක්‍රි.ව.975) අයත් වේ. මෙම අධ්‍යයනයෙන් වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් හෙළි වන තත්කාලිකන අධිකරණ ව්‍යවස්ථාවක ස්වභාවය විමර්ශනය කෙරේ. මෙම ලේඛනයෙහි විශේෂත්වය වන්නේ නීතිමය ව්‍යවස්ථාවක් ඇතුළත් කර තිබීමයි. ඒ අනුව වැරදි කරන පුද්ගලයන්ට ලබා දෙන දඬුවම්, වැරදි කරන පුද්ගලයින් සොයා නොදීම මුල් කර ගෙන දස ගම් ජනතාවට ලබා දෙන දඬුවම්, වැරදි කරන පුද්ගලයින්ට උදව් කරන පුද්ගලයන්ට ලබා දෙන දඬුවම් හා දස ගම්හි ජනයා විසින් පිළිපැදිය යුතු සිරිත් විරිත් පිළිබඳව තොරතුරු ප්‍රධාන වශයෙන් ඇතුළත් කොට තිබේ. එමෙන් ම එකළ අධිකරණයක ස්වරූපය ද මෙම ලිපියෙන් විවරණය කෙරේ. නීතිමය ව්‍යවස්ථාවක් ක්‍රියාවට නැංවීම සඳහා මෙකළ ප්‍රධාන ස්ථාන දෙකක් විය. අධිකරණය හා ප්‍රාදේශිය අධිකරණය යනු ඒවාය. වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් තත්කාලින අධිකරණයක ව්‍යවස්ථාව කෙසේ ක්‍රියාත්මක වූයේ ද එහි ක්‍රියාකාරීත්වය කෙබඳුවී ද යන්න අධ්‍යයනය කෙරෙහි විශේෂ අවදානය යොමු කෙරේ. මෙහිදි ප්‍රාථමික මූලාශ්‍රයන් වන්නේ ශිලා ලේඛන සංග්‍රහයන් ද ද්විතියික මූලාශ්‍රයන් වශයෙන් මේ සම්බධයෙන් සාකච්ඡා කරන වෙනත් කෘති ද යොදා ගැනෙයි. ඒ අනුව මෙම ශිලා ලිපියෙන් පිළිඹිබු වන තත්කාලින අධිකරණ ව්‍යවස්ථාව පිළිබඳව කරුණු සාකච්ඡා කරන අතර නිශ්චිත වශයෙන් නිගමනය කිරීමට වන සාධක ඇති කරුණු නිශ්චිත නිගමනයන් සහිතව ද විවාදපන්න කරුණු නිශ්චිත නිගමනයකට එළඹීමකින් තොරව දැක්වෙයි. එමෙන්ම වඩාත් නිවැරැදි කරුණු ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද - වේවැල්කැටිය ශිලා ලේඛනය, අධිකරණ ව්‍යවස්ථාව, ශිලා ලේඛන, දඬුවම් , මූලාශ්‍රය.

* සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය sewwandiw04@gmail.com